රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 32/89(1)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

1989 ජූනි මස 09 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

1980 ජූලි මස සිය තනතුරු අත්හැර ගිය රාජ්‍ය අංශයේ
සේවකයන් සම්බන්ධයෙන් තීරාකරණය කොට පවත්නා කරුණු
කඩිනමින් විසඳීම.

1980 ජූලි මස තනතුරු අත්හැර ගිය රාජ්‍ය නිලධාරීන්/සංස්ථා සේවකයන් සම්බන්ධයෙන් පහත දක්වා ඇති පරිදි වහාම ක්‍රියා කළයුතු යයි රජය තීරණය කර තිබේ.

02. 1980 ජූලි මස තනතුරු අත්හැර ගිය සේවයේ පිහිටුවා නොමැති නිලධාරීන්ටද/සේවකයන්ටද විශ්‍රාම ගිය තැනැත්තන්ටද පහත දක්වා ඇති පදනම අනුව විශ්‍රාම ප්‍රතිලාභ ලබාදෙනු ඇත.

(I) මෙම සියළුම නිලධාරීන්/සේවකයන් 1989.05.08 දිනය වයස අවුරුදු 55 පිරෙන දිනය යන දෙකින් කලින් එළඹෙන දිනය දක්වා සේවා කඩවීමක් නොමැතිව සේවා නියුක්තියේ රඳී සිටින ලද්දා සේ සලකනු ඇත.

(II) විශ්‍රාම වැටුප් සහ අනෙකුත් විශ්‍රාම ප්‍රතිලාභ 1989.05.08 දින හෝ වයස අවුරුදු 55 පිරෙන දිනය යන දෙකින් කලින් එළඹෙන දිනය දක්වා සියලු වේතනාධික ගෙවා ඇතැයි සහ 1980 ජූලි මස සිට සියළු වැටුප් වැඩිවීම් ලැබී ඇතැයි යන කල්පිත පදනම මත සලකා ගණන් බලනු ඇත.

(III) විශ්‍රාම වැටුප් ගණනය සහ අනෙකුත් විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම සඳහා සේවාකාලය ගණන් බැලීම පිණිස බලාත්මක වන විශ්‍රාම ලැබූ හෝ සේවා නියුක්තිය අවසන් කරනු ලැබූ දිනය වශයෙන් 89.05.08 දින හෝ අදාල නිලධාරියා වයස අවුරුදු 55 ට එළඹුනු දිනය යන දෙකින් කලින් එළඹෙන දිනය සලකනු ඇත. (කෙසේ වෙතත් 89.05.08 දින වන විට නිලධාරියාගේ වයස අවුරුදු 55 සම්පූර්ණ නොවන අවස්ථාවකදී විශ්‍රාම වැටුප හෝ විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම 89.05.08 දින සිට ක්‍රියාත්මක වනු ඇත.)

(IV) 1987.05.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 366 විධිවිධාන පරිදි සලයන ලද විශ්‍රාම සහ වෙනත් ප්‍රතිලාභ දැනටමත් ලබා ඇති

පුද්ගලයින් සම්බන්ධයෙන් වන විශ්‍රාම වැටුප් පාරිතෝෂිත සහ අනෙකුත් ප්‍රතිලාභ, ඉහත සඳහන් නියමයන්ට අනුකූලව ප්‍රතිශෝධනය කරනු ඇත.

(v) සේවයේ පිහිටුවීමට පෙර හෝ පසුව වයස අවුරුදු 55 සම්පූර්ණ වීම නිසා 80.12.03 දිනැති අංක 410/80 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මත හා එයට අදාළව පළකරන ලද ගැසට් නිවේදන ප්‍රකාර විශ්‍රාම ගිය තැනැත්තන්ද සමාන ප්‍රතිලාභ ලබනු ඇත.

(vi) විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දැරූ මුත් 1980 ජූලි මස සිට නැවත සේවයේ පිහිටුවන ලද දිනය දක්වා වූ කාලය ගණන් නොගැනීම නිසා විශ්‍රාම වැටුපකට හිමිකම ලැබීමට අවශ්‍ය මාස 120 ක සේවය සම්පූර්ණ නොකිරීමේ හේතුව මත විශ්‍රාම වැටුපක් නොමැතිව විශ්‍රාම ගිය නිලධාරීන් ද මෙම චක්‍රලේඛයේ නියමයන් අනුව නියමිත සහන ලබනු ඇත.

(vii) විශ්‍රාම වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ ගණන් බැලීමේදී රාජ්‍ය පළාත්පාලන හෝ සංස්ථා අංශවල 1980 ජූලි මස පරිවාස කාලයක් මත හෝ තාවකාලික සේවා නියුක්තියේ සේවයේ යෙදී සිටි සේවකයින් විශ්‍රාම වැටුප් සහ අනෙකුත් විශ්‍රාම ප්‍රතිලාභ ගණන් බැලීමේ කාර්යය උදෙසා 89.05.08 දින දක්වා අඛණ්ඩ සේවයක් තිබූ අය ලෙස සලකනු ඇත. නිලධාරියා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරණ ලද්දේ නම් ද, 89.05.08 දින තෙක් සේවාකාලය මාස 120 ට අඩු නම් ද ඔහුට විශ්‍රාම වැටුපකට හිමිකම ලැබීම සඳහා අවශ්‍ය අමතර මාස ගණන නිලධාරියාගේ සේවා කාලයට එකතු කරනු ලැබේ.

(viii) තාවකාලික, අනියම් හෝ විශ්‍රාම වැටුප් රහිත සේවයක සිටි නිලධාරීන් පවතින නීතිය යටතේ පාරිතෝෂිකයට හිමිකම ලබති. (එනම් එක වර්ෂයක සේවය සඳහා එක මසක වැටුප) අනියම් සේවකයන් සම්බන්ධයෙන් නම් ඔවුන් මසකට දින 30 ක් සේවය කළාසේ සලකා ඔවුන්ගේ මාසික වැටුප ගණනය කළයුතුය.

(ix) විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලබා ඇති අයකුට පරිවර්තිත විශ්‍රාම වැටුප හිමිවේ.

03. විශ්‍රාම ගැනීමට සිය මනාපය පළ නොකොට හෝ පාරිතෝෂිකයක් හෝ වෙනත් ප්‍රතිලාභයක් නොලබා මියගොස් ඇති සේවකයන්ගේ කලත්‍රයන්ට හෝ යැපෙන්නන්ට එකී මියගිය පුද්ගලයා 89.05.08 දින දක්වා හෝ වයස අවුරුදු 55 යන දින දෙකින් කලින් එළඹෙන දිනය දක්වා සේවා නියුක්තියේ යෙදී සිටියා සේ සලකා විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ වෙනත් ප්‍රතිලාභ ලැබීමට හිමිකම ඇත. මෙම චක්‍රලේඛය යටතේ ප්‍රදානය කෙරෙන අනෙකුත් සහනද මෙම නිලධාරීන්ට අදාල වනු ඇත.

04. මීට සම්බන්ධිත සේවායන් විසින් රාජ්‍ය, පළාත්පාලන සහ සංස්ථා අංශයේ ආයතන වලින් ලබාගෙන ඇති ණය සඳහා වන පොලිය අත්හැර දමනු ඇත. කෙසේ වුවද, මුල් මුදල අදාල නිලධාරියාට ගෙවනු ලබන විශ්‍රාම වැටුපෙන්/පාරිතෝෂිකයෙන් හෝ වෙනත් යම් මුදලකින් අඩුකරනු ඇත.

05. ඉහත සඳහන් නියමයන් අනුව විශ්‍රාම ලබන සියලුම සේවකයන්, ඔවුන්ගේ වයස, පළපුරුද්ද, සුදුසුකම් සහ කාර්යක්ෂමතාව මත නැවත සේවයට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබනු ඇත. එසේ නැවත සේවයට බඳවා ගැනීම, රජයේ දෙපාර්තමේන්තුවක, පළාත්පාලන ආයතනයක, සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක විය හැකිය. කෙසේ වුවද එසේ නැවත සේවයේ යෙදවීම සඳහා වන සියළුම අයදුම්පත් රාජ්‍ය නිලධරයන් නැවත සේවයේ යෙදවීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ලේකම්වරුන්ගේ අනු කමිටුවේ අනුමතිය සඳහා අදාල අමාත්‍යාංශය විසින් නිර්දේශ කළයුතුය.

එවැනි නැවත සේවයේ යෙදවීමකදී එසේ නැවත සේවයට බඳවාගනු ලබන පුද්ගලයාගේ විශ්‍රාම වැටුප අඩුරා තබනු ඇත. 89.05.08 දින සිට නැවත සේවයට බඳවාගනු ලබන දිනය දක්වා වූ කාලය සේවා රහිත කාලයක් සේ සලකනු ලබන අතර යම් හෙයකින් ඔහු 1980 ජූලි මස දරමින් සිටි තනතුරේම නැවත සේවයට බඳවා ගන්නා ලද්දේ නම්, ඔහුගේ 89.05.08 දින දක්වා වන පූර්ව සේවය සම්බන්ධව වූ කිසියම් හිමිකමකට; එනම් කිසියම් වසර ගණනක් සම්පූර්ණ කිරීම මත සිටි උසස්වීමකට සහ කිසියම් වසර ගණනක් සම්පූර්ණ කිරීම මත කිසියම් විභාගයකට පෙනී සිටීමට අයිතිය වැනි හිමිකමකට ඔවුනට අයිතිය ඇත. මෙම හිමිකම එවැනි පත්වීමක් සම්බන්ධව පවත්නා කොන්දේසි වලට යටත් වනු ඇත. කෙසේ වෙතත් අතීතයට බලපවත්වන පරිදි කිසිදු උසස්වීමක් සලකා බලනු නොලැබේ.

06. 1984.06.06 දිනැති 254 සහ 1987.05.05 දිනැති 366 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 89.05.08 දින සිට බලපවත්වන පරිදි ඉවත් කරගනු ලැබේ.

07. 1980 ජූලි මස සේවය හැරගිය කරුණ නිසාම නැවත සේවයේ පිහිටුවන ලද නිලධාරීන්ට නොගෙවන ලද නියමිත වැටුප් වර්ධක එම වැටුප් වර්ධක නියමිත දින සිට හිඟ මුදල් නොමැතිව නැවත ලබාදෙනු ලැබේ.

08. මෙම තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛත්වය දියයුතු අතර 1989.07.07 දිනට පෙර අවසන් කළයුතුය,

09. විශ්‍රාම/පාරිතෝෂික ගෙවීම් සම්බන්ධව රාජ්‍ය සංස්ථා සහ අනෙකුත් ආයතන විසින් ඉහත දක්වා ඇති ක්‍රමය අනුගමනය කළයුතුය.

10. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය අවශ්‍ය පරිදි සංශෝධනය කෙරෙනු ඇත.

11. අයදුම්පත්‍ර සම්බන්ධ කටයුතු නිමකිරීම සඳහා සහ පසුව 89.07.14 දිනට පෙර ප්‍රගතිය මාවෙත වාර්තා කිරීමට සඳහා මගේ අමාත්‍යාංශයේ දැනටමත් කර ඇති පරිදි අදාල අමාත්‍යාංශ වලද රාජ්‍ය ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් විශේෂ ඒකක පිහිටුවිය යුතුය. වාර්තා නොමැතිවීම

හෝ වෙනත් නිදහසට කරුණු, මෙම තීරණ නියමානුකූලව ප්‍රමටව ක්‍රියාත්මක කිරීමට බාධාවක් නොවිය යුතුය. වාර්තා සොයා ගැනීමට හෝ අදාල නිලධාරීන්/සේවකයන් සපයන ලියවිලි මත අසම්පූර්ණ වාර්තා සම්පූර්ණ කිරීමට අදාල බලධාරීන් සෑම උත්සාහයක්ම දැරිය යුතුය. සහන අයදුම්පතක් ඉදිරිපත් කර නොමැති වුවද මෙම චක්‍රලේඛය යටතේ සහන ලැබීමට අයිතිය ඇති නිලධාරීන්/සේවකයන් සිටී නම් ඔවුන්ට ඒ බව දන්වා එම සහන ලබාදීමට ඔබ කටයුතු කළයුතුය.

(සිරිල් ගමගේ)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය.